**ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2025**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 02 වන ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කළ යුතු වුවද, 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලට ලැබිය යුතු ආදායම් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2025 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශ්වයන්ගෙන් ශ්‍රී ලංකා රේගුව වෙත අයවිය යුතු හිඟ දණ්ඩන හා අභිමිකිරීම් රු.මිලියන 7,152ක් වූ අතර, ශ්‍රී ලංකා රේගුවේ ගිණුම් අංශය වෙත දණ්ඩන හා අභිමිකිරීම් ලෙස ලැබී තිබුණද ත්‍යාග ගොනු සකස් කර නොතිබූ මුදල රු.මිලියන 2,064ක් විය. ඒ අනුව, එකතුව රු.මිලියන 9,216ක් වූ එම මුදලින් අරමුදලට හිමි සියයට 20ක කොටස වන රු.මිලියන 1,843ක් අරමුදලට ලැබිය යුතු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අතිරික්තය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | දණ්ඩන ලෙස මුදල් ලැබීමේදී පොදු තැන්පත් ගිණුමට බැර කරනු ලබන අතර ඉන් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට (50%), කළමනාකරණ වන්දි අරමුදලට (20%) සහ රාජ්‍ය ආදායමට (30%) බැර කරනු ලබන්නේ විමර්ශන ගොනුව අවසන්ව ත්‍යාග ගොනු ගෙවීම සිදු කරන අවස්ථාවේදීය. එතෙක් එම මුදල් රේගුවේ පොදු තැන්පත් ගිණුමේ පවතී. කළමනාකරණ හා වන්දි අරමුදලට ලැබීමක් ලෙස සටහන් කරනුයේ සත්‍ය වශයෙන්ම පොදු තැන්පත් ගිණුමෙන් ඉවත් වී රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට ලැබෙන අවස්ථාවේදීය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව, අරමුදලට ලැබිය යුතු ආදායම් උපචිත පදනම මත නිසි පරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 65 ඡේදය ප්‍රකාරව වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයෙහිම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා කරන තත්ත්වයන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරවද ගිණුම්ගත කළ යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය රු.254,775,123ක් වූ ආයුධ, පුස්තකාල පොත්, පරිගණක හා පරිගණක උපාංග, රූපවාහිනී යන්ත්‍ර, විද්‍යාගාර උපකරණ, ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ යනාදී වත්කම් සම්බන්ධයෙන් ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර, අවශ්‍ය ගිණුම්කරණ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. ඉදිරියේදී නිරීක්ෂිත පරිදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදු කළ යුතුය. |

**1.5.2. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල (රු) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ආයුධ, පරිගණක, පරිගණක උපාංග, රූපවාහින යන්ත්‍ර සහ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 236,235,192 | ස්ථාවර වත්කම් ලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා | වත්කම් සත්‍යාපනය හා සංනිරීක්ෂණය කිරීමට අවශ්‍ය වන පරිදි ඉදිරියේදී ලේඛණ සකස් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දීමට සටහන්කර ගතිමි. | වත්කම්වල පැවැත්ම, ආරක්ෂාව හා භාරකාරීත්වය තහවුරු කරගැනීම සඳහා යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන යාමත්, නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණ සිදුකර එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමත් කළ යුතුය. |
| (ii) | වැද්දුම් හා සවිකිරීම් වත්කම් | 20,511,735 | | | |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 වන මුදල් රෙගුලාසිය සහ | තත්කාර්ය අතුරු අග්‍රිමය කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවද, අවස්ථා 15කදී ලබාදී තිබූ රු.5,600 සිට රු.500,000ක් දක්වා | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගත් කාර්යය නිම වූ විගසම අතුරු අග්‍රිම පියවන ලෙස අදාල අංශවල නිලධාරීන් හා | අත්තිකාරම් පියවීමේදී මුදල් රෙගුලාසි විධිවිධානයන්ට අනුගත විය යුතුය. |

| | | |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 | පරාසයක වූ අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 11 සිට 138ක කාල පරාසයක් ගතවී තිබුණි. | අත්තිකාරම් ලබාගත් නිලධාරීන්ව දැනුවත් කිරීමට කටයුතු කළ අතර ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවීමට වග බලා ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,396,574,389ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,346,928,257ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.49,646,132ක හෙවත් සියයට 1.4ක සුළු වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.4,017,657කින් අඩුවීමත් මුළු ආදායම රු.45,628,475කින් වැඩිවීමත් මෙම වර්ධනයට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සාඵල්‍යය වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැලසුම් කිරීමකින් තොරව අරමුදලට මුදල් වෙන් කිරීම හේතුවෙන්, අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 15,843 ක් වූ අරමුදලේ සමුච්චිත ශේෂය 2025 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 19,239ක් දක්වා රු.මිලියන 3,396කින් හෙවත් සියයට 21 කින් වර්ධනය වී තිබුණි. අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩව වර්ධනය සඳහා පහත සඳහන් හේතු ද මූලික ලෙස බලපා තිබුණි. | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ 05ක අරමුදලේ එකතු ආදායම රු.11,786,494,198ක් වූ නමුත්, එම කාලය තුළ අරමුදලින් දරා තිබූ වියදම රු.254,995,574ක් (ක්ෂයවීම් හැර) එනම් එකතු ආදායමෙන් සියයට 2ක් | රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ කටයුතු සිදුකර ඇත. | අරමුදලින් වන්දි ගෙවීම සඳහා පැහැදිලි නිර්ණායක සකස් කිරීමත්, තාත්වික ඇස්තමේන්තු මත අරමුදලට මුදල් වෙන් |

| | | | |
|---|---|---|---|
| | පමණක් වූ අතර, ඉතිරි මුදල අරමුදලේ සමුච්චිත ශේෂයට එකතු කර තිබීම. | | කිරීමත් අවධානය යොමු කල යුතුය. |
| (ii) | රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා කෘතිම බුද්ධිය සම්බන්ධ කරන ලද නවීන තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබීමත්, නිලධාරින් විසින් සාමාන්‍ය රාජකාරි අතරතුර හඳුනා ගනු ලබන රේගු වැරදි සඳහාම බහුල වශයෙන් ත්‍යාග ගෙවීමට සිදුවීමත් හේතුවෙන් ඉන් සියයට 20 කට සමාන ප්‍රතිශතයක් අරමුදලට බැර වීම. | Rapiscan පද්ධතිය සඳහා කෘතිම බුද්ධිය ඕනෑම අවස්ථාවකදී යොදා ගැනීමේ හැකියාව අදාළ පද්ධතිය තුළ මේ වනවිටත් පැවතියද ඒ සඳහා දැරීමට සිදුවන අධික පිරිවැය නිසා ක්‍රියාත්මක කර නොමැත. කෙසේවෙතත්, රේගු නිලධාරින්ගේ සුවිශේෂී හැකියාව, දැනුම හා අත්දැකීම් රේගු බදු වැරදි, වංචා හඳුනා ගැනීමේදී උපයෝගි කර ගනු ලබන අතර රේගු ආඥා පනතේ විධිවිධාන හා දෙපාර්තමේන්තු නියෝගයන් ප්‍රකාරව අදාළ මුදල් මෙම අරමුදලට බැර කෙරෙනු ඇත. රේගු බදු වංචා හෝ තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ රට තුළට ගෙන ඒම වැළැක්වීමේ අන්තර්ජාතිකව පිළිගත් ක්‍රමවේදයක් ලෙස නිලධාරින්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග මුදල් ලබාදීම සිදු කරනු ලබන බව නිරීක්ෂණය කරමි. | රේගු බදු වංචාවන් හඳුනාගැනීම හා පාලනය කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කෘත්‍රිම බුද්ධිය ඇතුළු නවීන තාක්ෂණික හා දත්ත විශ්ලේෂණ ක්‍රමවේද පිරිවැය-ප්‍රතිලාභය සලකා බලා ක්‍රමානුකූලව හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ඇතැම් අවස්ථාවලදී වංචා කිරීමට උත්සාහ කළ භාණ්ඩ සහ බදු වටිනාකමට සාපේක්ෂව තෙගුණයක වටිනාකමක් දක්වා දණ්ඩන පැනවීම, රේගු වැරදිවල කැපී පෙනෙන අඩුවීමක් සිදු වී නොතිබීම, වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනවල ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාල අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබීම. | රේගු වංචා සම්බන්ධ වරදට භාණ්ඩවල වටිනාකම මෙන් තෙගුණයක් දක්වා දණ්ඩන පැනවීම හා වැඩි වංචා ප්‍රමාණයක් හෙළිදරව් කර ඒ සඳහා දණ්ඩන/ අභිමි කිරීම් පැනවීම, දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන සම්බන්ධව සහ ආදායම් ඉලක්ක සපුරා ගැනීමට විශාල වශයෙන් දායක වී ඇති බවත් එය අරමුදලට එකතු වන මුදල් ප්‍රමාණය හා රජයේ ආදායම ඉහල යාමටත් හේතුවක් වී ඇති බවත් නිරීක්ෂණය කරමි. කෙසේවෙතත්, අංක 792 සහ 05.11.1993 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව අරමුදලේ මුදල් භාවිතා කිරීමේදී පනවා ඇති සීමා කිරීම් අරමුදලේ ගිණුම් ශේෂය ඉහල යාමට බලපා ඇති කරුණු වලින් මූලික කරුණක් බව ද නිරීක්ෂණය කරමි. | රේගු ආඥා පනත හා අදාල අරමුදල් සඳහා වූ නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමට අවධානය යොමු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරතවීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා අරමුදල් සපයා ගැනීම අරමුදලේ මූලික අරමුණක් ලෙස හඳුනාගෙන ඇතත් ඉකුත් වර්ෂ 13 ක කාල පරිච්ඡේදය තුළ එවැනි එවැනි ආපදාවන් සම්බන්ධයෙන් කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබීම. | පෙර වර්ෂ 13 තුළ එවැනි ආපදාවන් වෙනුවෙන් වන්දි ඉල්ලීම් කිසිවක් ලැබී නොතිබුන බව කාරුණිකව දන්වා සිටිමි. | අරමුදලේ වර්තමාන අවශ්‍යතාවයන් හා අරමුණු යළි සමාලෝචනය කර, ඒ අනුව දණ්ඩන හා අභිමිකිරීම්වලින් අරමුදලට වෙන් කරනු ලබන ප්‍රතිශතය ද යෝග්‍ය පරිදි නැවත සමාලෝචනය කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අරමුදලේ තථ්‍ය හා අයවැයගත වියදම් සැසඳීමේදී, වියදම් විෂයයන් 07ක් අතරින් විෂයයන් 04ක සියයට 38 සිට සියයට 100 දක්වා පරාසයක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. තවද, රාජසන්තක භාණ්ඩ අලෙවියෙන් ලද ආදායමේ තථ්‍ය හා අයවැයගත අගයන් අතරද සියයට 44ක විචලනයක් පැවතුණි. ඒ අනුව, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ හා පාලන මෙවලමක් ලෙස භාවිත කර නොතිබූ බව නිරීක්ෂණය විය. | හැකිතාක් දුරට විචලනයන් අවම වන ආකාරයෙන් ඇස්තමේන්තු සකස් කිරීමට සටහන් කර ගතිමි. | නිවැරදි හා තාත්වික පුරෝකථන මත අයවැය ඇස්තමේන්තු සකස් කර, අයවැය හා තථ්‍ය දත්ත අතර සැලකිය යුතු විචලනයන් ඇතිවීමට හේතු විධිමත්ව සමාලෝචනය කළ යුතුය. |